isharaiz.com

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම

සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 8(1) වගන්තිය සහ එහි ව්‍යතිරේඛය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ 2027.01.01 දින සිට ඇතිවීමට නියමිත පුරප්පාඩුව සඳහා නිර්දේශ කරනු ලැබීමට සලකා බැලීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව සහ ඉහත කී පනතේ විධිවිධාන ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන්, පහත සඳහන් ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තන් විය යුතු ය :-

i. නීතිය;
ii. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම;
iii. වෝහාරික විගණනය;
iv. වෝහාරික ගිණුම්කරණය;
v. ඉංජිනේරු විද්‍යාව,
vi. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍යතාන්ත්‍රික සේවා;
vii. මහජන කටයුතු කළමනාරණය; හෝ
viii. රාජ්‍ය පරිපාලනය.

අයදුම්කරුවන් විසින්, පත්වීමට අදාළ සුදුසුකම් සහ නුසුදුසුකම් සම්බන්ධයෙන් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ සඳහන් විධිවිධාන කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) 'ක්ෂණික පිවිසුම්' යටතේ 'අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 ඔක්තෝබර් මස 16 වැනි දින හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයේ විෂයය ලෙස 'අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 ඔක්තෝබර් මස 01 වැනි දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

10 - 403